Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පුනරීක්ෂණ ඇගයීම් වැඩ සටහන I

## පළමු වාරය

## ගණිතය

ශ්‍රේණිය - 5

කාලය : පැය 1.30

නම:..............................................................................................................

**(01) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(1) 2(3)4 7 5 - රවුම් කළ ඉලක්කමේ ස්ථානීය අගය වන්නේ,

1) 3000 2) 30000 3) 1000 4) 300


(2) 5 0 6 9 3 ඉරි ඇඳි ඉලක්කමෙන් නිරූපණය වන අගය වන්නේ,

1) 6000 2) 600 3) 100 4) 60

(3) 3 5 [4] 2 1 - කොටු කළ ඉලක්කම් ඇති ස්ථානය වන්නේ,

1) දහයස්ථානය 2) සියයස්ථානය 3) හාරසිය ස්ථානය 4) දහස ස්ථානය

(4)




ගණක රාමුවේ දැක්වෙන අගයට 10ක් එකතු කළ විට පිළිතුරු වන්නේ,

1) 50 231 2) 50 241 3) 50 331 4) 5 231

(5)

| | |
|---|---|
| 5 | 0 |
| 4 | 9 |

කොටුව තුළ ඇති ඉලක්කම් සියල්ලම භාවිත කර සෑදිය හැකි විශාල ම සංඛ්‍යාවේත් කුඩාම සංඛ්‍යාවේත් වෙනස වන්නේ,

1) 5 8 0 1 2) 5 0 8 1 3) 5 4 8 1 4) 9 0 8 1

(6) 3 5 4 7 2, 3 5 8 8 5, 3 5 0 5 3, 3 5 2 7 5, 3 5 9 6 4

මෙම සංඛ්‍යා ආරෝහණ ක්‍රමයට සකස් කළ විට හරි මැද සංඛ්‍යාව වන්නේ,

1) 3 5 9 6 4 2) 3 5 0 5 3 3) 3 5 2 7 5 4) 3 5 4 7 2

(7) පෑන් 36 කින් 3 / 4 කට අයත් පෑන් ගණන වන්නේ,

1) 12 2) 48 3) 27 4) 18

(8) 00 : 35 මෙම වේලාව සාමාන්‍ය ඔරලෝසු වේලාවෙන් දැක් වූ විට වේලාව වන්නේ,

1) පෙ. ව. 12. 35 2) පෙ. ව. 00 . 35 3) ප. ව. 24. 35 4) ප. ව. 12. 35

9) පේර ගෙඩි 132ක් ළමයි තිදෙනෙක් අතර බෙදූ විට එක් අයෙකුට ලැබෙන පේර ගෙඩි ගණන

1) 30 2) 12 3) 44 4) 34

(10) 22, 26. 28, 30, 34 මෙම සංඛ්‍යා වලින් සංඛ්‍යා රටාවක් වීම සඳහා ඉවත් කළ යුතු සංඛ්‍යාව වන්නේ,

1) 26 2) 28 3) 30 4) 22

2 x 10 = 20

Sri Lanka's Largest Past Paper Bank – iskolee.

## II කොටස

**(02) ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලියන්න.**

සංඛ්‍යා නාමය ලියන්න.

1) 4 2 3 0 5 - ..........................................................................

2) 5 8 4 7 3 - ..........................................................................

ඉලක්කමෙන් ලියන්න.

3) විසිහය දහස් එකසිය හතලිස් හත - ..........................................................

4) සියක් දහස - ..........................................................................

විහිදුවා ලියන්න.

5) 68 507 - ..........................................................................

6) 35 421 - ..........................................................................

ආරෝහණ ක්‍රමයට ලියන්න.

7) 2 5 9 7 1, 9 7 1 2 5, 5 9 2 7 1 ..........................................................

අවරෝහණ ක්‍රමයට ලියන්න.

8) 2 0 6 0 8, 8 0 2 3, 1 4 6 2 8 ..........................................................

(1 x 8 = 8)

**(03) වගුව ඇසුරෙන් පිළිතුරු ලියන්න.**

| | අඹ බීම | දොඩම් බීම |
|---|---|---|
| ජනවාරි | 1532 | 1375 |
| පෙබරවාරි | 836 | 911 |
| මාර්තු | 2462 | 2458 |

1) ජනවාරි මාසයෙහි නිපද වූ මුළු බීම බෝතල් සංඛ්‍යාව කීය ද? ..............................................

2) මාර්තු මාසයෙහි නිපද වූ මුළු බීම බෝතල් සංඛ්‍යාව කීය ද? ..............................................

3) මාස 3 හි නිපද වූ මුළු අඹ බීම බෝතල් සංඛ්‍යාව කීය ද? ..............................................

4) මාස 3 හි නිපද වූ මුළු දොඩම් බීම බෝතල් සංඛ්‍යාව කීය ද? ..............................................

(2 x 4 = 8)

**(04) රටාව හඳුනා ගෙන හිස්තැනට එන සංඛ්‍යාව ලියන්න.**

1) 2, 7, 12, 17, ........ .........

2) ........ ........ 18, 24, 30, 36

3) 3, 11, 19, 27 ......... ...........

(1 x 6 = 6)


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(05) පහත වගුව පුරවන්න.


| ද්‍රව්‍ය ප්‍රමාණය | $\frac{1}{4}$ ක ඇති ප්‍රමාණය | $\frac{2}{4}$ ක ඇති ප්‍රමාණය | $\frac{3}{4}$ ක ඇති ප්‍රමාණය |
|---|---|---|---|
| 12 | | | |
| 20 | | | |
| 24 | | | |
| 36 | | | |

(1 x 12 = 12)


(06) අඳුරු කළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස දක්වන්න.



1.....................................




2.....................................




3.....................................

(2 x 3 = 6)

(07) පහත වේලාවන් ඔරලෝසු මුහුණතේ දක්වන්න.








1) වේලාව 5 පසු වී මිනිත්තු 35

2) වේලාව 11 ට මිනිත්තු 10 යි

(2 x 2 = 4)

(08) පහත ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාව පස්වරු වේලාවක් ලෙස සම්මත ක්‍රමයට ලියන්න.




.............................................

3) පෙරවරු 2.45 ඩිජිටල් වේලාවෙන් දක්වන්න?

.............................................................

4) පස්වරු 9.10 පැය විසිහතර වේලාවෙන් දක්වන්න?

.............................................................

(2 x 3 = 6)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**(09) දීර්ඝ ක්‍රමයට බෙදන්න.**

(1) 2 | 2 1 6  (2) 5 | 5 1 8  (3) 5 | 3 6 0

(3 x 3 = 9)

**(10) ගැටලු විසඳන්න.**

(1) මල්පැළ තවානක ඉද්ද පැළ 3874 ක් ද, ඕකිඩ් පැළ 2579 ක් ද, රෝස පැළ 1023 ක් ද තිබිණි. මුලු පැළ සංඛ්‍යාව සොයන්න.

(2) දුම්රිය නැවතුම්පළකට දිනක දී ඇතුළු වූ මගීන් සංඛ්‍යාව 4497 ක් වන අතර පිට වූ මගීන් සංඛ්‍යාව 2359 කි. ඇතුළු වූ සහ පිට වූ මගීන් සංඛ්‍යාව අතර වෙනස කොපමණ ද?

(3) මගියකු 25 km 500 m ක දුරකින් 18 km 500 m ක දුරක් දුම්රියෙන් ද ඉතුරු දුර බසයකින් ද ගමන් කරන ලදී. බසයෙන් ගිය දුර ප්‍රමාණය කොපමණ ද?

(4) රුපියල් 8. 50 කට පැන්සලක් හා රුපියල් 30. 00 කතන්දර පොතක් මිල දී ගත් විට ගෙවිය යුතු මුදල කීයද?

(5) සමන් රුපියල් 65ක පාට පැන්සල් පෙට්ටියක් ගැනීමට රුපියල් 100ක නෝට්ටුවක් දුන්නේ ය. සමන්ට ලැබුණු ඉතිරි මුදල කීයද?

(6) එක් කූඩයක රඹුටන් ගෙඩි 150 බැගින් කූඩ තුනක රඹුටන් අසුරා ඇත. කූඩ තුනෙහි ඇති මුළු රඹුටන් ගෙඩි ගණන කීයද?

(7) එක් සිසුවෙකුට 4 බැගින් බෙදා දීම සඳහා පාසලට අභ්‍යාස පොත් 804ක් ලැබිණි. පාසලෙහි සිටින සිසුන් ගණන කීයද?

(3 x 7 = 21)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පුනරීක්ෂණ ඇගයීම් වැඩ සටහන I

පළමු වාරය

## මව්බස I

ශ්‍රේණිය - 5

කාලය : පැය 1.30

නම:..........................................................................................................

• **නිවැරදි පිළිතුර තෝරා ඉරි ගසන්න**

(01) සිංහල හෝඩියේ අක්ෂර ගණන වන්නේ
1 18 කි　　2 52 කි　　3 60 කි　　4 58 කි

(2) ඛ, ඡ, ඨ, ථ, ඵ මෙම අකුරු හඳුන්වන්නේ
1 සඤ්ඤක අකුරු　　2 මහප්‍රාණ අකුරු　　3 මූර්ධජ අකුරු　　4 අල්පප්‍රාණ අකුරු

(03) ආරෝහණ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර වන්නේ
1 හ, ව　　2 ර, ට　　3 ල, ද　　4 ම, ප

(04) 5 ශ්‍රේණියේදී අකුරු ලියන නිවැරදි ප්‍රමාණය වන්නේ
1 රූලෙන් 1/2 කි　　2 රූලෙන් 2/3 කි　　3 රූලෙන් 3/4 කි　　4 රූලෙන් එකකි

(05) දීර්ඝ පාපිල්ල පමණක් යෙදුණු වචනයකි
1 රුපියල　　2 රූපය　　3 සූකිරි　　4 කුඩැල්ලා

(06) [ ! ] මෙම විරාම ලක්ෂණය හඳුන්වන නම වන්නේ
1 කොමාව　　2 විස්මයාදී ලකුණ　　3 ප්‍රශ්නාර්ථය　　4 තිත

(07) <u>රු</u>වනි <u>රු</u>වන්පුරයෙන් <u>රු</u>ලං අලුවා ගෙනාවාය.
ඉරි ඇඳි අකුරේ පිල්ලමේ නම වන්නේ
1 ඇදය　　2 දික් ඇදපිල්ල　　3 කෙටි පාපිල්ල　　4 ඇලපිල්ල

(08) [ළු] මෙම අක්ෂරය හඳුන්වන්නේ
1 සඤ්ඤක [ළු]　　2 මූර්ධජ [ළු]　　3 මහප්‍රාණ [ළු]　　4 තාලුජ [ළු]

(09) "පුංචි අපට දැන් තේරෙයි " යනු
1 චිත්‍රපටයකි　　2 වේදිකා නාට්‍යයකි　　3 විද්‍යා ප්‍රබන්ධයකි　　4 ගීතයකි

(10) මහවැලි, කැලණි, කළු, වලවේ යන ගංගා හතර ආරම්භ වන කන්ද වන්නේ
1 සමනළ කන්ද　　2 පිදුරුතලාගල කන්ද
3 හපුතලේ කන්ද　　4 බඹර කන්ද

(ල. 20)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

■ **ඡේදය ඇසුරින් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

අපි හතර පැයක් පමණ යාත්‍රා කොට දූපතේ දකුණු පැත්තට ළඟා වීමු. මෙවර අප ඔරුව නැවැත්වූයේ පළමු දෙවාරයෙහිම නැවැත් වූ තැනට වඩා හොඳ තැනක ය. ගල්කුළු කිහිපයක් ඇති ඒ ගං ඉවුර මඩවළක් නොවී ය. දිග බොරුකකුල් රාශියක් වැනි මුල්වලින් නැඟී සිටි කඩොල් ගස් පෙළ දූපත වටා යාමට තනන ලද පාලමක් වැන්න. අපි ඔරුවෙන් බැස ඔරුවේ තිබුණු සියලු දේ ගෙන ඔරුවද ගොඩට ඇද්දෙමු. ඉවුරට මඳක් ඈතින් තිබුණු ලී කොට තුනක් පෙරළා තබා එහි ගල් දමා තළා තොටුපළක් ද සෑදුවෙමු.

මඩොල් දූව
මාර්ටින් වික්‍රමසිංහ

**(1) ඡේදය ඇසුරින් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1 ඔරුව ළඟා වූයේ දූපතේ කුමන පැත්තකට ද? ..............................................................

2 ගං ඉවුරේ තිබුණේ මොනවාද? ..............................................................

3 ඡේදයට අනුව කඩොල් ගස් පෙළ හඳුන්වා ඇත්තේ කෙසේද? ..............................................................

2 ඔරුව ගොඩට ඇදීමට පෙර කළේ කුමක් ද? ..............................................................

5 තොටුපළ සෑදුවේ කෙසේද? ..............................................................

(ල. 10)

**(2) ඡේදය කියවා පහත ප්‍රකාශ හරිනම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( ✗ ) ලකුණ ද වරහන තුළ යොදන්න.**

1 තුන් පැයක් පමණ යාත්‍රා කොට දූපතට ළඟාවීමු. ( )

2 මෙවර ඔරුව නැවැත්වූයේ වඩා හොඳ තැනකය. ( )

3 ගල් කුළු කිහිපයක් ඇති ගං ඉවුරේ මඩ වළක් විය. ( )

4 කඩොල් ගස් පෙළ දූපතට යෑමට සෑදූ තොටුපළක් වැනිය. ( )

5 තොටුපළ සෑදුවේ ලීකොට තුනක් පෙරළා ගල් දමා තැලීමෙනි. ( ) (ල. 5)

**(3) අනුපිළිවෙලට අංක යොදන්න.**

1 ඉතුරු අඹත් කජුත් කඩපොළට ගොස් විකුණුවෙමු. ( )

2 දවල් කෑම කා මඩොල්දූව බලා ගියෙමු. ( )

3 වේළන ලද අඹ සහ කජු ඇට පොඩි ගමරාළට දුන්නෙමු. ( )

4 හාල්, මිරිස් හා ලුණු ද ගත්තෙමු. ( )

5 ගෙන ආ කෑම අවසන් වන්නට පෙර ඔරුව රැගෙන එගොඩට ගියෙමු. ( )

(ල. 5)

**(4) පහත කියමනට ගැළපෙන ප්‍රස්ථාව පිරුළු තෝරා ලියන්න.**

(ඉඳිකටුවයි නූලයි වගේ / මඩේ හිටවපු ඉන්න වගේ / ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ / ඉඟුරු දී මිරිස් ගත්තා වගේ / ඉබ්බගෙන් පිහාටු ඉල්ලනවා වගේ

1 එක තීරණයක නොසිටීම - ..............................................................

2 එක කරදරයකින් බේරෙන්න ගිහින් තවත් කරදරයක වැටීම - ..............................................................

3 සෑම විටම තමන් සමග තවත් අයෙක් එකට සිටීම - ..............................................................

4 කෙනෙකුගෙන් කෙසේවත් ලබාගත නොහැකි දෙයක් ලබාගැනීමට උත්සහ දැරීම - ..............................................................
..............................................................

5 අනුන් රවට්ටන්න ගිහින් තමන් රැවටීම - ..............................................................

(ල. 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(5) සමාන පදය සොයා යා කරන්න

| | |
|---|---|
| ගස | ගුවන |
| අහස | විනය |
| අම්මා | රුක |
| දූපත | මව |
| කැලෑව | දිවයින |

(ල. 5)

■ විරුද්ධ පදය සොයා යා කරන්න

| | |
|---|---|
| ගැළපෙන | අපිරිසිදු |
| පිපෙනවා | අයහපත් |
| කීකරු | නොගැළපෙන |
| පිරිසිදු | පරවෙනවා |
| යහපත් | අකීකරු |

(ල. 5)

(6) වචන ඇසුරෙන් වගුව පුරවන්න.

පාසලේ, පැන්සල, පාසිකුඩා, පින්සර, පෑන, පූර්ණා, පිරිසිදු, පැහැදිලි, පේෂල, පුබුදු, පෝස්ටරය, පොලිතින්, පෙට්ටි, පේදුරු, පෝළිම, පෑලියගොඩ, පුහුණු, පීරිසිය, පිදීම, පූසා, පෙනේරය, පොහොර

| පිල්ල | වචන | වචන |
|---|---|---|
| 1 ඇලපිල්ල | | |
| 2 කෙටි ඇදපිල්ල | | |
| 3 දික් ඇදපිල්ල | | |
| 4 කෙටි ඉස්පිල්ල | | |
| 5 දික් ඉස්පිල්ල | | |
| 6 කෙටි පාපිල්ල | | |
| 7 දික් පාපිල්ල | | |
| 8 කොම්බුව | | |
| 9 කොම්බුව සහිත හල් කිරීම | | |
| 10 කොම්බුව සහිත ඇලපිල්ල | | |
| 11 කොම්බුව ඇලපිල්ල සහිත හල් කිරීම | | |

(ල. 11)

(7) පහත සඳහන් වචන ගළපා වාක්‍ය සකස්කර ලියන්න.

1 දකුණු / ළඟාවිය / දූපතේ / පැත්තට /

.....................................................................................................................................

2 වඩා / ඔරුව / හොඳ / නැවැත්වූයේ / තැනකය

.....................................................................................................................................

3 නොවී ය / ගං / මඩවළක් / ඉවුරෙහි

.....................................................................................................................................

(ල. 06)

(8) පහත වාක්‍ය සඳහා සුදුසු විරාම ලකුණු යොදන්න.

? , " " !

1 මගේ පුතාගේ අතේ ඇඟිලි කීයද

2 මැදැඟිල්ල තමා ලොක්කා නංගි උත්තර දුන්නා

3 ඇයගේ කැපවීම පුදුමාකාරය

(ල. 04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**(9) කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.**

මහවැලි කැලණි වලවේ කළු යන ගංගා

..................................................................................................

බැවුම තැනිතලා හෙල් අතරින් රිංගා

.................................................................................................. (ල. 04)

**(10) ගැළපෙන ක්‍රියාපදය වරහන් තුළින් තෝරා ලියන්න.**

(ආවාය, ගත්තා ය, ආවේ ය, ගත්තේ ය, වැටුණි, කළේය)

1 අයියා ගෙදර එනවිට කේක් ගෙන..........................................

2 නංගී කරඹ, කොහුකිරිල්ල කඩාගෙන..........................................

3 ඔහු දිවුල් ගෙඩි කිහිපයක් කා හමාර..........................................

4 ඈ සීනි බෝලය මා හා බෙද..........................................

5 සීනි බෝල බෝතලය බිමට.......................................... (ල. 05)

■ " මම මී මැස්සෙක් වෙමි " යන මාතෘකාව යටතේ උක්ත ආඛ්‍යාත නිවැරදිව වැකි 5ක් ලියන්න වැකියකට වචන පහකට වැඩි විය යුතුයි.

1. ..................................................................................................

2 ..................................................................................................

3 ..................................................................................................

4 ..................................................................................................

5 ..................................................................................................

(ල10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පුනරීක්ෂණ ඇගයීම් වැඩ සටහන I

පළමු වාරය

## පරිසරය

ශ්‍රේණිය - 5

කාලය : පැය 1.30

නම:.......................................................................................................

■ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.** (ලකුණු 2 x 10 = 20)

(1) ජාතික කොඩිය ඔසවන විට සිටිය යුත්තේ,
1 පහසුවෙන්ය 2 සීරුවෙන්ය 3 සැහැල්ලුවෙන්ය 4 සිත්සේ ය

(2) කෙනෙකුගෙන් තවත් කෙනෙකුට බෝ නොවන රෝගයකි,
1 සරම්ප 2 අධි රුධිර පීඩනය 3 කොරෝනා 4 සෙම්ප්‍රතිශ්‍යාව

(3) අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළඳෙන රෝගයක් නොවන්නේ,
1 පාචනය 2 ජල භීතිකාව 3 කොළරාව 4 සෙංගමාලය

(4) තෛපොංගල් උත්සවය සමරන ආගමික ස්ථානය වන්නේ,
1 පන්සල 2 මස්ජිදය 3 කතෝලික පල්ලිය 4 කෝවිල

(5) මුද්‍රවපු කිරි පැට්ටියක් මිලදී ගැනීමේ දී සැලකිලිමත් විය යුතුම කරුණක් වන්නේ,
1 මිල 2 ආවරණය 3 කල් ඉකුත්වීමේ දිනය 4 ප්‍රමාණය

(6) රාජ්‍ය ලාංඡනයේ ඉහළින්ම දක්නට ඇත්තේ,
1 වී කරල් ය 2 පලාපෙතිය 3 කඩුව රැගත් සිංහයා ය 4 ධර්ම චක්‍රය

(7) අනාරක්ෂිත අවස්ථාවක් වන්නේ,
1 අකුණු අවස්ථාවක දී එළිමහනේ ගමන් බිමන් නොයාම
2 රත් වූ භාජනයක් ඇල්ලීම සඳහා රෙදි කඩක් භාවිත කිරීම
3 පයින් ගමන් කරන විට පාරේ දකුණු පසින් ගමන් කිරීම
4 වාහන තදබදය ඇති අවස්ථාවක පාර හරහා මාරු වීම

(8) ප්‍රදේශයේ ඇති පරිපාලන ආයතනයක් නොවන්නේ,
1 පොලිස් ස්ථානය 2 නගර සභාව
3 ප්‍රාදේශීය සභාව 4 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය


(9) "තුරු පෙළ අවට සැදීම - යුත් සෙවනැල්" කවිය මගින් විස්තර වන්නේ,
1 ඔිපනායක යෝධ පුස්වැල 2 කැබිලිත්තාව සියඹලා ගහ
3 මන්නාරම බඹ්බැබ් ගස 4 දෙනිපිටිය නුග රුක

(10) මාංස භක්ෂක සතෙක් වන්නේ,
1 කුකුළා 2 බත්කූරා 3 කපුටා 4 බල්ලා

(11) තාප බලාගාර, ජල විදුලි බලය, තාප කෝෂ මගින් විදුලිය නිපදවීමට පිළිවෙළින් යොදා ගනු ලබන්නේ,
1 ජලය, ගල් අඟුරු, හිරු එළිය 2 ගල් අඟුරු, ගෑස්, හිරු එළිය
3 ගල් අඟුරු, ජලය, හිරු එළිය 4 හිරු එළිය, ජලය, ගල් අඟුරු

(12) මිනිසා මගින් සතුන්ට ලැබෙන වාසියක් නොවන්නේ,
1 ආහාර ලබාදීම 2 වාසස්ථාන සාදා දීම
3 ආර්ථික වාසි ලබාදීම 4 ආරක්ෂාව සැපයීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(13) 


මෙම කොටුව සකස් කරගනු ලබන්නේ,

1 එක්ගුඩු පැනීම සඳහා
2 වලකඩු දැමීම සඳහා
3 එළුවන් කෑම ක්‍රීඩාව සඳහා
4 බට්ටා පැනීම සඳහා

(14) ශාක පත්‍රයේ විශාලත්වය වැඩිවන ආකාරයෙන් ශාක පත්‍ර දැක්වෙන පිළිතුර වන්නේ,
1 වට්ටක්කා, නිවිති, කෙසෙල්, ගොටුකොළ　　2 නිවිති, ගොටුකොළ, කෙසෙල්, වට්ටක්කා
3 නිවිති, වට්ටක්කා, ගොටුකොළ, කෙසෙල්　　4 ගොටුකොළ, නිවිති, වට්ටක්කා, කෙසෙල්

(15) ඓතිහාසික දළදා පෙරහැර පවත්වන නගරය වන්නේ,
1 මහියංගනය　2 බෙල්ලන්විල　3 කතරගම　4 මහනුවර

(16) සන්නිවේදනයක් සිදුවීමට අවශ්‍ය අංගයක් වන්නේ
1 දුරකථනය　2 මුද්දරය　3 හැඳුනුම්පත　4 මාධ්‍යය

(17) කැප්ටන් ඩෝසන් කුලුන තිබෙන්නේ,
1 ඇඹිබැක්කේ ය　2 දෙවුන්දර ය　3 කඩුගන්නාවේ ය　4 මහියංගනයේය

(18) සුළං දිශා දර්ශකයකින්
1 සුළඟේ වේගය මනියි　　2 සුළඟ හමන දිශාව පෙන්වයි
3 සුළඟේ තිබෙන ජල ප්‍රමාණය මනියි　　4 උතුරු දිශාව සොයා ගනියි

(19) වැඩ, පහසු කර ගැනීමට කප්පි භාවිතා කරන අවස්ථාවකි.
1 ගලක් කඩන විට　　2 යකඩ තළන විට
3 ළිඳෙන් ජලය අඳින විට　　4 ආනත තලයක් දිගේ පෙට්ටියක් ඉහළට අදින විට

(20) මහමඟ ගමන් කිරීමේදී අප විසින් පවත්වා ගත යුතු යහපත් පුරුද්දක් නොවන්නේ,
1 රංචු වශයෙන් ගමන් කිරීමෙන් වැළකීම　　2 මාර්ග නීති රීති අනුගමනය කිරීම
3 මඟ දෙපස ඇති දේපළවලට හානි නොකිරීම　　4 දුරකථන භාවිතා කරමින් ගමන් කිරීම

(ල. 20)

## (02) පහත ප්‍රකාශනවල හිස්තැනට සුදුසු පිළිතුර පහත කොටුව තුළින් තෝරා ලියන්න

1) කැරොල් ගීත සන්දර්ශන පවත්වන්නේ ..........................................ආගමිකයන් ය

2) අපේ උරුමයක් වූ බිතු සිතුවම් දැක ගත හැකි ස්ථානයකි ..............................................

3) අතීත කාලයේ දී තෙල් සිඳීමට ..............................................යොදා ගැනුණි.

4) මිලාද් උත්සවය පවත්වනු ලබන්නේ ........................................ආගමිකයන්ය.

5) අධික පැණි රස සහිත ආහාර ගැනීමෙන් ....................................රෝගය වැළඳීමට ඉඩ ඇත.

6) ..............................................ශ්‍රී ලංකාවට ආවේණික සතෙකි.

7) ..........................................පරිසරයේ වෙනස්වීම් පිළිබඳව දැනුම්වත් කිරීමට උපකාර කරන සතෙකි.

8) පෘෂ්ටයට ඇලී සිටීම සඳහා විශේෂ පාද සහිත සතෙකි..........................................

| | | |
|---|---|---|
| වැහිලිහිණියා | සෙක්කුව | සීගිරිය |
| කොටියා | ඉසුරුමුණිය | කලවැද්ද |
| කතෝලික | දියවැඩියාව | ඉස්ලාම් |
| හින්දු | හූනා | සකපෝරුව |

(ල. 08)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**(03) පහත ප්‍රකාශන නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( × ) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

1) සැම දෙනාම ශ්‍රී ලාංකිකයෝ ලෙස සැම ආගමකටම ගරු කළ යුතුය. ( )

2) බණ්ඩක්කා ශාක පත්‍රය බුව සහිත රවුම් ශාක පත්‍රයකි. ( )

3) කෝමාරිකා සුළු පිළිස්සීම්වලදී ඖෂධයක් ලෙස යොදා ගනියි. ( )

4) වර්ෂාව නිසා පොළොව මතුපිට පස නිසරුවීමෙන් භූමිය වගාවට නුසුදුසු වෙයි. ( )

5) ශ්‍රී ලාංකිකයන්ගේ අධ්‍යාපනයේ පියා ලෙස C. W. W. කන්නන්ගර මැතිතුමා විරුදාවලි නොලැබීය. ( )

6) චුම්භක දෙකක සමාන කෙළවර දෙකක් ළංකල විට ඒවා ආකර්ශනය වේ. ( )

7) යම් පුද්ගලයෙකුගෙන් හෝ ස්ථානයකින් සේවයක් ලබා ගන්නා විට ආචාරශීලීව හැසිරීම නොකළ යුතුය. ( )

8) ඉදල භාවිතා කිරීමේ දී ඉරටු දෙපැත්තට භාවිතා වන ලෙස ඉදලේ දෙපැත්ත මාරු කරමින් අතු ගෑම කළ යුතුය. ( )

9) බල්ලකු සපා කෑ විට සපා කෑ ස්ථානය රෙදි පටියකින් ගැට ගැසිය යුතුයි. ( )

10) අතීතයේ දී මුතුන් මිත්තෝ ජලය පිරිසිදු කිරීමට ඉඟිනි ඇට භාවිතා කළහ. ( )

(ල. 10)

**(04) පහත පිළිතුරු කොටුව තුළින් පිළිතුරු ගෙන වගුව නිවැරදිව පුරවන්න.**


| ශාක භක්ෂක | මාංශ භක්ෂක | සර්ව භක්ෂක | ශ්‍රී ලංකාවට ආවේණික සතුන් | ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂීන් |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| බත්කූරා<br>ගවයා<br>නරියා | වලිකුකුළා<br>සිංහයා<br>හබන් කුකුළා | එළුවා<br>කපුටා<br>හික්මීයා | ගිරා මලිත්තා<br>කුකුළා<br>හාවා | බල්ලා<br>කළුවැදුරා<br>කලවැද්දා |

(ල. 15)

**(05) 1) පහත ඇටවුම සකස් කිරීමෙන් පරීක්ෂා කර බලන්නේ කුමක් ද?**

.................................................................................................... (ල. 02)




2) මෙහි ඊතලවලින් දක්වා ඇති ද්‍රව්‍ය නම් කරන්න.

I) ..............................................


ii) ..............................................


iii) ..............................................


(ල. 03)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**(06) පහත රූප හඳුනාගෙන නිවැරදි නම ලියන්න.**


(I)  ..........................................................................

(ii)  ..........................................................................

(iii)  ..........................................................................

(iv) 

..........................................................................

(v)  ..........................................................................

(ල. 10)

**(07) පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) පහත රූප සටහනේ දැක්වෙන නිර්මාණය කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය 2ක් ලියන්න.



i) ..........................................................................

ii) ..........................................................................

(ල. 02)